Please check the examination details below before entering your candidate information

| Candidate surname | Other names |
|---|---|
| | |

**Pearson Edexcel International GCSE**

Centre Number

Candidate Number

# Thursday 23 May 2019

Morning (Time: 2 hour 30 minutes) | Paper Reference **4SI1/01**

# Sinhala

## Paper 1: Reading, Writing and Translation

**You do not need any other materials.**

Total Marks

## Instructions

- Use **black** ink or ball-point pen.
- **Fill in the boxes** at the top of this page with your name, centre number and candidate number.
- There are **three** sections you must answer:
  – Section A Questions 1–4
  – Section B Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c)
  – Section C Question 7.
- Answer the questions in the spaces provided
  *– there may be more space than you need.*
- You must **not** use a dictionary.

## Information

- The total mark for this paper is 100.
- The marks for **each** question are shown in brackets
  *– use this as a guide as to how much time to spend on each question.*

## Advice

- Read each question carefully before you start to answer it.
- Check your answers if you have time at the end.

*Turn over* ▶

P58204A
©2019 Pearson Education Ltd.
1/1/1/1/1/1/

P 5 8 2 0 4 A 0 1 2 0

Pearson

https://xtremepape.rs/

**SECTION A: READING**

**Answer ALL questions.**

**Write your answers in the spaces provided.**

**Multiple-choice questions must be answered with a cross in a box ☒. If you change your mind about an answer, put a line through the box ☒ and then mark your new answer with a cross ☒. Open-response questions do not have to be written in full sentences and you may respond using single words or phrases.**

**1** පහත සඳහන් පාඨය කියවා එම තොරතුරුවලට අනුව දී ඇති සිංහල වාක්‍යවල හිස් තැන් පුරවන්න. කොටුව තුළ නිවැරදි අක්ෂරය ලියන්න.

එළවළු හා පලතුරු

ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි දේශගුණික කලාපවල එළවළු හා පලතුරු විශේෂ අසූවක් පමණ වැවෙති. කඳුකරයේ සිසිල් දේශගුණික තත්ත්වය කැරට්, ලීක්ස් සහ මල්ගෝවා වැනි සෞම්‍ය කලාපීය බෝග සඳහා යෝග්‍ය වන අතර, පහතරට වියළි කලාපය අමු මිරිස්, රතු ළූණු හා කෙසෙල් වැනි ඝර්ම කලාපීය එළවළු හා පලතුරු සඳහා සුදුසු ය.

ඉන්නල හා කිරි අල නමින් ජන ව්‍යවහාරයේ එන ඇතැම් දේශීය අල වර්ග ද, දිය යට වැවෙන කොහිල අල හා නෙළුම් අල ද, දෙල්, කොස් හා මුරුංගා වැනි නිත්‍ය බෝග ද, රටට විදේශ විනිමය ගෙනෙන ප්‍රධාන බෝග වෙති.

ශ්‍රී ලංකාව වාර්ෂිකව නැවුම් සහ සකස් කළ එළවළු සහ පලතුරු මෙට්‍රික් ටොන් 800,000කට වඩා ලෝකයේ විවිධ රටවලට අපනයනය කරයි. සියයට අසූවක් පමණ නැවුම් නිෂ්පාදන මැද පෙරදිගට හා මාලදිවයින් දූපත්වලට යවන අතර සියයට හැත්තෑ පහක් පමණ සකස් කළ නිෂ්පාදන යුරෝපීය වෙළඳපොළට යවයි.

ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරුවල ගුණාත්මක බව ආරක්ෂා කිරීම සඳහා හරිතාගාර තුළ විශේෂයෙන් වැඩි දියුණු කරන ලද බෝග වගා ක්‍රම, ප්‍රශස්ත ඇසුරුම් සහ දියුණු ප්‍රවාහන ක්‍රම භාවිත වේ.



P 5 8 2 0 4 A 0 2 2 0

https://xtremepape.rs/

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

| | | | | |
|---|---|---|---|---|
| **A** පහතරට | **B** කැරට් | **C** අසූවක් | **D** ඉන්නල |
| **E** අඹ | **F** උඩරට | **G** යුරෝපයට | **H** වියළි |
| **I** මාලදිවයිනට | **J** ශීතල | **K** ප්‍රශස්ත ඇසුරුම් | **L** විදේශ තාක්ෂණය |
| **M** කොස් | | | |

| | | |
|---|---|---|
| උදාහරණය: | ශ්‍රී ලංකාවේ බෝග වර්ග ……… පමණ වැවේ. | *C* |
| **1** (a) | කඳුකරයේ ……… දේශගුණයක් ඇත. | |
| **1** (b) | කෙසෙල් ……… වැවෙන බෝගයකි. | |
| **1** (c) | ……… දේශීය අල වර්ගයක් නොවීය. | |
| **1** (d) | ශ්‍රී ලංකාව අපනයන කරන ……… නිත්‍ය බෝගවලින් එකකි. | |
| **1** (e) | නැවුම් නිෂ්පාදන ……… යැවීම පහසුය. | |
| **1** (f) | ……… භාවිතය එළවළු හා පලතුරුවල ගුණාත්මක බව තහවුරු කරන එක් ක්‍රමයකි. | |

**(Total for Question 1 = 6 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA


https://xtremepape.rs/
P58204A0320

2 ලංකාවේ ප්‍රවාහන ක්‍රම ගැන මෙම පාසල් සිසුන් තිදෙනාගේ ප්‍රකාශ කියවා පහත වගුව පුරවන්න. නිවැරදි කොටු 8 තුළ **එක් කතිරය** බැගින් යොදන්න. ඇතැම් වාක්‍යයකට හෝ පුද්ගලයෙකුට **කතිර එකකට** වඩා තිබිය හැකි අතර ඇතැම් විට **එකක්වත් නොතිබිය හැකිය.**

## ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්‍රම

**කිරන් 1**



මගේ මාතෘකාව 'ලංකාවේ පැරණි ප්‍රවාහන ක්‍රම' යන්නයි. ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන කටයුතු කරනු ලැබූ බවට ඓතිහාසික හා සාහිත්‍යාගත තොරතුරු රැසක් හමු වෙනවා. එය ගුවනින්, මුහුදින් හා ගොඩබිමින් යන සෑම ක්‍රමයකින්ම සිදු කරනු ලැබූ බවට සාක්ෂි අවශ්‍ය තරම් තිබෙනවා. රාවණා රජුගේ දඬු මොනර යන්ත්‍රය, ජය ශ්‍රී මහා බෝධිය වැඩම වීමේ පුවත හා ගැල් කවි සාහිත්‍ය ඊට කදිම නිදසුන් කිහිපයක්.

**නිපුණි 2**



මම කථා කරන්නේ 'නූතන ලංකාවේ ප්‍රවාහන ක්‍රම' ගැනයි. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයත් සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රවාහන සේවය වෙසෙස් දියුණුවකට පත් වුණා. ගුවන් යානා, දුම්රිය, බස් රථ හා මොටර් රථ ඇතුළු නවීන ප්‍රවාහන ක්‍රම රැසක් එයින් අපට දායාද වුණා. ඒ හේතුවෙන් ප්‍රවාහන සේවා හා සංචාරක ව්‍යාපාරය ආදී ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින නිසා එදිනෙදා කටයුතු බොහෝ පහසු වී තිබෙනවා.

**ෆාතිමා 3**



'අනාගත ලංකාවේ ප්‍රවාහන ක්‍රම' මගේ මාතෘකාවයි. නව තාක්ෂණයේ දියුණුවත් සමඟ ලෝකයේ සංචාරක ව්‍යාපාරය හා ප්‍රවාහන ක්‍රම අද ඉතා දියුණු තත්ත්වයෙන් පවතිනවා. එය හෙට දවසේ කෙසේ වේවි ද කියා සිතා ගන්නටත් බැරි තරම් ශීඝ්‍රයෙන් දියුණු වෙමින් තියෙනවා. ශ්‍රී ලංකාව ද ඉතා වේගයෙන් තාක්ෂණයෙන් හා යටිතල පහසුකම්වලින් දියුණුවෙමින් පවතින බැවින් අපට ද ලෝකයේ අති නවීන දියුණු ප්‍රවාහන ක්‍රම නුදුරේම අත්දකින්නට හැකි වේවි.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



https://xtremepape.rs/

P58204A0420

| | | කිරන්**1** | නිපුණි**2** | ෆාතිමා**3** |
|---|---|---|---|---|
| **උදාහරණය:** | පැරණි ප්‍රවාහන ක්‍රම ගැන කථා කරයි. | ☒ | ☐ | ☐ |
| **A** | පැල් කවි සාහිත්‍ය ගැන පවසයි. | ☐ | ☐ | ☐ |
| **B** | සංචාරක ව්‍යාපාරය පිළිබඳව සඳහන් කරයි. | ☐ | ☐ | ☐ |
| **C** | උදාහරණ ගෙන හැර පාමින් කථා කරයි. | ☐ | ☐ | ☐ |
| **D** | ගුවන් යානා ගැන සඳහනක් කරයි. | ☐ | ☐ | ☐ |
| **E** | ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින බව ප්‍රකාශ කරයි. | ☐ | ☐ | ☐ |
| **F** | හෙට ගැන සුභවාදීව සිතයි. | ☐ | ☐ | ☐ |

**(Total for Question 2 = 8 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



https://xtremepape.rs/

**3** ශ්‍රී ලංකාවේ කලාව හා මානව ශාස්ත්‍ර පිළිබඳ තොරතුරු ඇතුළත් මෙම ලිපිය කියවන්න.
**සිංහල** වචන යොදා ඊට පහතින් දී ඇති වාක්‍යවල හිස් තැන් පුරවන්න.

**කලාව සහ මානව ශාස්ත්‍ර**

ශ්‍රී ලංකාව සතුව ඉපැරණි හා සාරවත් සාහිත්‍යයක් ඇත. එය ලිඛිත සාහිත්‍යය හා වාචික සාහිත්‍යය වශයෙන් දෙයාකාරය. ක්‍රි. ව. පස්වන සියවස වන විට සිංහල හා දෙමළ ලේඛකයින් ඉතිහාසය හා ආගම මෙන්ම ලෞකික විෂයයන් පිළිබඳව ද කෘති රචනා කරමින් සිටියහ. මෙම සම්ප්‍රදාය පවත්වාගෙන යමින් අද දවසේ ප්‍රබන්ධ රචකයින්, කවියන්, නාට්‍ය රචකයින් හා මාධ්‍යවේදීන් රාජ්‍ය භාෂා තුනෙන්ම සිය කෘති රචනා කරමින් සිටින අතර ඔවුන්ගේ ඇතැම් කෘති අනෙකුත් භාෂාවලට ද පරිවර්තනය වී ඇත. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පුස්තකාල හා මහජන පුස්තකාල එක් කාලයක දකුණු ආසියාවේ හොඳම පුස්තකාල ලෙස ප්‍රකටව පැවතිණි. කුඹල් කර්මාන්තය හා කූඩා විවීම වැනි ඇතැම් සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත අලංකරණයට වඩා ප්‍රායෝගිකත්වයට මුල් තැනක් දී ඇත. ලී කැටයම් කලාව වැනි අනෙකුත් කලාවන් ඉතා විචිත්‍රවත් මෙන්ම ජාත්‍යන්තර හා දේශීය වෙළඳපොළ ද දිනා ගැනීමට සමත්ව ඇත. සියලු කලා අතර විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ බෙර වාදනය හා නර්තනය වැනි ප්‍රාසංගික කලාවන් වඩාත් කැපී පෙනෙයි. සම්පූර්ණයෙන්ම වෘත්තීය මට්ටමේ වේදිකා නිෂ්පාදන සාමාන්‍ය පරිදි රඟ දැක්වෙන නමුත් අර්ධ වෘත්තීය මට්ටමේ නූතන ලෞකික කලාවන්ට ද ඉඩක් ඇත. තවද දිවයින තුළ දකුණු ආසියානු හා බටහිර සම්භාව්‍ය සංගීතය මෙන්ම සමකාලීන ජනප්‍රිය සංගීතය, ජාතික හා විදේශීය ශිල්පීන්ගේ සිනමා ගීත ආදී වශයෙන් නොයෙක් ආකාරයේ සංගීත ආර ගණනාවක් ඇත.



P 5 8 2 0 4 A 0 6 2 0
https://xtremepape.rs/
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

උදාහරණය: ශ්‍රී ලංකාවේ ඉතා පැරණි හා සාරවත් ....................සාහිත්‍යයක්.................... ඇත.

(a) ශ්‍රී ලංකාවේ සාහිත්‍ය .................................................. හා .................................................. ලෙස බෙදා දැක්විය හැකියි. **(2)**

(b) ඉතිහාසය ආදි විවිධ විෂයයන් මුලින්ම ලියන්න පටන් ගත්තේ .................................................. දීය. **(1)**

(c) වර්තමානයේ ලේඛකයින් අතර .................................................. හා .................................................. සිටිති. **(2)**

(d) මෙහි .................................................. හා .................................................. වශයෙන් පුස්තකාල වර්ග දෙකක් සඳහන් වෙති. **(2)**

(e) .................................................. හා .................................................. යනු ප්‍රායෝගිකත්වයට මුල් තැනක් දුන් කර්මාන්ත දෙකකි. **(2)**

(f) ජාත්‍යන්තරය දිනාගත් කර්මාන්තයක් වන්නේ .................................................. ය. **(1)**

(g) .................................................. ප්‍රාසංගික කලාවන්ගෙන් එකකි. **(1)**

(h) .................................................. ශ්‍රී ලංකාවේ දක්නට ඇති සංගීත විශේෂයකි. **(1)**

**(Total for Question 3 = 12 marks)**





https://xtremepape.rs/

**4** ඩබ්ලිව්. ඕ. ටී. ප්‍රනාන්දු මහතා විසින් පරිවර්තනය කරන ලද **'පියෙකුගෙන් ඔහුගේ දුවට යැවුණු ලිපි'** කෘතියෙන් උපුටා ගන්නා ලද පහත සඳහන් ඡේදය කියවන්න.

## ආදි ජනාවාස

"කෘෂිකාර්මික දිවි පෙවෙත ඇරඹීමත් සමගම ඇති වූ තවත් වැදගත් දෙයක් වූයේ ගම් හා නගර වශයෙන් ජනාවාස ඇති වීමයි. කෘෂිකර්මාන්තය ඇරඹීමට ප්‍රථම කැලෑවල ජීවත් වූ මිනිස්සු දඩයම් කරමින් කාලය ගත කළහ. ඔවුනට එකම ස්ථානයක පමණක් විසීමට අවශ්‍යතාවක් නොවීය. එසේ වූයේ තමන් කැමති තැනකට ගොස් දඩයම් කිරීමට හැකි වීමත් ඊට අමතරව ගව, බැටළු ආදී සතුන් සමඟ තැනින් තැනට යෑමට සිදු වීමත් නිසාය. එක් ස්ථානයක කාලයක් තණ කෑමෙන් පසු සතුනට කෑමට ආහාර හිඟ වූ විට සතුන් දක්කාගෙන වෙනත් තණ පිට්ටනි ඇති පෙදෙස් කරා ගමන් කිරීමට ඔවුනට සිදු විය. මුළු ගෝත්‍රයම මේ අනුව තැනින් තැනට ගමන් ගත්තේය.

කෘෂිකර්මාන්තය ඇරඹීමෙන් පසු තම ගම් බිම් අතහැර යෑම ඔවුනට අසීරු විය. සී සෑම, වැපිරීම හා අස්වනු නෙළාගැනීම ආදිය කළ යුතු වූ බැවින් මිනිසාට එසේ තම ගම් බිම් අතහැර යෑම කළ නොහැක්කක් විය. මේ අනුව ගම් හා නගර බිහි විය.

ගොවිතැන මිනිසාගේ ජීවිතය වඩා පහසු කරලීය. මුළු දවස තිස්සේම දඩයමේ යෙදීමට වඩා කෘෂිකර්මාන්තයේ නියැළී ආහාර වගා කර ගැනීම වඩා පහසු බව ඔවුහු තේරුම් ගත්හ. දඩයමින් යැපෙන විට ඔවුනට සෑම දිනයකම දඩයම් කිරීමට සිදු වූ අතර ගොවිතැන් කිරීමේදී එවැනි ගැහැටකට මුහුණ දීමට සිදු වූයේ නැත. වරකට ගොවිතැනින් වැඩි ආහාර ප්‍රමාණයක් නිපදවන අතර ඒවා පරිස්සමෙන් කල් තබා ආහාරයට ගැනීමේ වාසිය ඔවුනට අත් විය.

මිනිසා දඩයක්කරුවෙකුව සිටින තාක් කල් ඔහුට ආහාර සුරක්ෂිතව ගබඩා කර ගැනීමේ හැකියාවක් නොතිබුණි. ආහාර වේලෙන් වේල පිරිමසා ගැනීමට ඔහුට සිදු විය. ඔහුට මුදල් හා වෙනත් දෑ තැන්පත් කිරීමට බැංකු නොවීය."

(a) පාඨයේ ඇති තොරතුරුවලට අනුව අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න. පිළිතුරු සඳහා සම්පූර්ණ වාක්‍ය ලිවීම අවශ්‍ය නොවේ.

(i) මෙහි සඳහන් ජනාවාස වර්ග දෙක මොනවාද?

**(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

(ii) කෘෂිකර්මාන්තය ඇරඹීමට ප්‍රථම මිනිස්සු ආහාර සොයා ගත්තේ කෙසේද?

**(1)**

..............................................................................................................................................

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA



P 5 8 2 0 4 A 0 8 2 0

https://xtremepape.rs/

(iii) ආදි මානවයින් එක ස්ථානයක රැඳී නොසිටීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න. **(2)**

..............................................................................................................................................................................

..............................................................................................................................................................................

(iv) ගව, බැටළු ආදි සතුන් තැනින් තැනට රැගෙන ගියේ ඇයි? **(1)**

..............................................................................................................................................................................

(v) මිනිසුන්ට තම ගම්බිම් අතහැර යෑමට අපහසු වූයේ ඇයි? **(1)**

..............................................................................................................................................................................

(vi) ගොවිතැනින් මිනිසාට ලැබුණු වාසිය කුමක්ද? **(1)**

..............................................................................................................................................................................

(vii) දඩයම් කිරීමෙන් ජීවත් වීම අපහසු වූයේ ඇයි? **(1)**

..............................................................................................................................................................................

(viii) මිනිසාට ආහාරපාන කල් තබා ගත නොහැකි වූයේ කිනම් අවධියේද? **(1)**

..............................................................................................................................................................................

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



https://xtremepape.rs/

P 5 8 2 0 4 A 0 9 2 0

(b) ග්‍රාමීය හා නාගරික ජීවිත ගැන සිසුන් දෙදෙනෙකු විසින් කරන මෙම සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු දෙන්න.

අමර
ගැමි ජනතාව තුළ පවතින ආගන්තුක සත්කාරය, සරල දිවි පැවැත්ම ආදී උතුම් ගුණාංග පුදුම එලවනසුලුයි. ඈත අතීතයේ සිට පැවත එන මෙම යහ පුරුදු ශ්‍රී ලාංකේය අනන්‍යතාවක් වගේම රටට ආඩම්බරයක් වන කාරණයක්. විශේෂයෙන්ම ආගන්තුක සත්කාරයට අපේ රටේ ගැමියා දක්වන කැමැත්ත ඉතා ඉහළින් කැපී පෙනෙනවා. ඊට උදාහරණ පැරණි ජන සමාජයේ ඇති නොයෙක් කථා ප්‍රවෘත්තිවලින් හෙළි වෙනවා. අතීතයේ විසූ ගැමියාගේ සරල දිවි පැවැත්ම හරිම පුදුමාකාරයි. සංස්කෘතික සිරිත් විරිත්වලින් ලැබුණු ආභාෂය සමහර විට ගැමියන්ගේ මෙම සරල දිවි පැවැත්මට හේතු වන්නට ඇත. කුඹුරු කපා පාගා අස්වනු නෙළා ගැනීමෙන් අනතුරුව මුළු ගමම එකතු වී විනෝදය පිණිස ජන නැටුම් හා නාට්‍ය සංදර්ශන රඟ දැක්වූ බව කවුරුත් දන්නා දෙයක්. මේ අනුව ගමේ සාමූහිකත්වය හා එකමුතුකම දියුණු වූ බව අපට පිළිගන්න පුළුවන්. ගමේ ප්‍රධානියාට සවන් දීමෙන් නායකත්වයට ගරු කිරීම, සම්පත් සමව බෙදා හදා ගැනීම හා ඔවුන්ගේ සාමූහික ආරක්ෂාව සපයා ගැනීම වැනි වැදගත් සමාජයීය අවශ්‍යතා රැසක් එමගින් ඉටුකර ගත් බව පේනවා.

සාමා
ඔබ ඔය කියන සුන්දර ගම නම් අද අපේ රටේ දකින්නට නැහැ. ගමත් අද වන විට නගරයක් වී හමාරයි. නවීන තාක්ෂණයෙන්, ජංගම දුරකථන භාවිතයෙන් හා රටට එන අලුත්ම විලාසිතාවලින් ගම පිරිලා තියෙන්නේ. ඉස්සර කාලේ තිබුණු වටිනා සිරිත් විරිත් බොහොමයක් අද කාලේ ගම්වල දකින්නට නැහැ. එක අතකට දැන් තිබෙන ගමට වඩා නගරය හොඳයි කියල මට සිතෙනවා. නගරයේ ගමනා ගමන පහසුකම්, තැපැල් සේවා හා කඩ සාප්පු සංකීර්ණ ආදිය තිබෙන නිසා නාගරික ජීවිතය හැම අතින්ම පහසුයි. නාගරික ජනතාවට වැඩි පහසුකම් රැසක් ලැබී තිබෙනවා. නගරය තුළ දියුණුවේ නව දොරටු, නව අත්හදා බැලීම් හා විවිධ සමාජ සම්බන්ධතා ආදිය ඇති වෙනවා. එහි අධ්‍යාපනයට හොඳ පහසුකම් තිබෙනවා වගේම වෛද්‍ය සත්කාර, රැකියා අවස්ථා ආදිය ද තිබෙනවා. මේ ආදි පහසුකම් රැසක් තිබෙන නිසා නගරය ගමට වඩා විනෝද ජනක ස්ථානයක් කියලයි මං හිතන්නෙ.

(i) පළමු සිසුවාගේ අදහස් සාරාංශ කරන්න:

- ගැමියන්ගේ ගුණවත්කම: **(1)**
- ගැමි ජනතාවගේ එදිනෙදා ජීවිතය: **(1)**

.......................................................................................................................................

.......................................................................................................................................

(ii) දෙවන සිසුවාගේ අදහස් සාරාංශ කරන්න:

- ගැමි දිවියේ වෙනස්කම්: **(1)**
- නාගරික ජීවිතයේ වාසි: **(1)**

.......................................................................................................................................

.......................................................................................................................................

**(Total for Question 4 = 14 marks)**

**TOTAL FOR SECTION A = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA



P 5 8 2 0 4 A 0 1 0 2 0
https://xtremepape.rs/

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

## SECTION B: WRITING

Answer Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c).

**Write your answers in the spaces provided.**

**5**

පාසල් චාරිකා

| | |
|---|---|
| ප්‍රයෝජන | අධ්‍යාපනික වටිනාකම |
| මෑතකදී ගිය චාරිකාවක් | අනාගත චාරිකාවක් |

වචන 85ක් පමණ භාවිත කරමින් පාසල් චාරිකාවක් ගැන **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න.
ඉහත සඳහන් වචන සියල්ලම භාවිත කළ යුතුය.



https://xtremepape.rs/

P 5 8 2 0 4 A 0 1 1 2 0

**(Total for Question 5 = 14 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



https://xtremepape.rs/

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**6** පහත සඳහන් විකල්ප තුනෙන් එකක් තෝරා ගෙන, වචන 145ක පමණ වාක්‍ය රචනයක් සිංහලෙන් ලියන්න. ඔබ තෝරා ගත් ප්‍රශ්නයට සරිලන ආකාරයට පිළිතුරු ලිවිය යුතුය.

### පළමු විකල්පය

(a)



**'වැඩිහිටියන්ට සවන් දෙමු'** යන මැයෙන් පාසල් වාර සඟරාවට රචනාවක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- වැඩිහිටියන් දෙන උපදෙස් පිළිපැදීමේ ඇති වටිනාකම
- එදා බාල පරපුර වැඩිහිටියන්ගේ ඇසුරට ළංව සිටි ආකාරය
- අනාගතයේ පරම්පරා අතර සම්බන්ධතාව දියුණු කිරීම සඳහා ඔබ කරන යෝජනා

**(26)**

### දෙවන විකල්පය

(b)

මම මිතුරන් කණ්ඩායමක් සමඟ ශ්‍රී ලංකාව නැරඹීම සඳහා පැමිණීමට සැලසුම් කරමින් සිටිමි. මට සීගිරිය හා දඹුල්ල වැනි සංචාරක ආකර්ෂණයක් ඇති ඓතිහාසික ස්ථාන පිළිබඳ විස්තරයක් එවන්න ඔබට පුළුවන්ද?

අමීෂා

අමීෂාට විද්‍යුත් ලිපියක් ලියන්න. ඔබේ ලිපියේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- ඓතිහාසික ස්ථානවල ඇති වැදගත්කම
- අතීතයේ මෙම ස්ථානවල තිබූ ශ්‍රී විභූතිය
- එම ස්ථාන මතු පරපුර සඳහා ආරක්ෂා කිරීමේ ඇති වටිනාකම

**(26)**


https://xtremepape.rs/

තෙවන විකල්පය

(c) 'ශ්‍රී ලංකාවේ ක්‍රීඩා' යන තේමාව යටතේ අන්තර්ජාල වෙබ් අඩවියකට යැවීම සඳහා ලිපියක් ලියන්න. ඔබේ ලිපියේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- ශ්‍රී ලංකවේ ජනප්‍රිය ක්‍රීඩා
- අතීතයේ තිබූ ක්‍රීඩා කිහිපයක්
- ක්‍රීඩාව දියුණු කිරීම සඳහා අනාගතයේ ගත යුතු පියවර

(26)

**Indicate which question you are answering by marking a cross ☒ . If you change your mind, put a line through the box ☒ and then indicate your new question with a cross ☒ .**

☒ **Question 6(a)** ☒ **Question 6(b)** ☒ **Question 6(c)**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA





https://xtremepape.rs/

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA


https://xtremepape.rs/

**(Total for Question 6 = 26 marks)**

**TOTAL FOR SECTION B = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA





https://xtremepape.rs/

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

## SECTION C: TRANSLATION INTO SINHALA

**Write your answer in the space provided.**

**7** පහත සඳහන් ඡේදය **සිංහලට** නඟන්න.

The use of social media is widely spread and common in the developed countries where computing equipment, handheld devices, internet facility and electricity are ever-present. Sri Lanka is a developing island nation situated in the Indian Ocean southeast of India, and is the 24th-largest island in the world. It is a low-income country where technologies are proliferating rapidly in all parts of the country, particularly in urban areas. In the Sri Lankan context the usage of social media increased rapidly during the last five years. Its mixed population, rich culture, variety of religions and languages reflect in the news industry.

**(20)**



https://xtremepape.rs/

P 5 8 2 0 4 A 0 1 7 2 0

(Total for Question 7 = 20 marks)

**TOTAL FOR SECTION C = 20 MARKS**
**TOTAL FOR PAPER = 100 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



https://xtremepape.rs/

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA


P58204A01920
https://xtremepape.rs/

BLANK PAGE

**Source information**

**Question 2**
© paul prescott / Alamy Stock Photo
© Alan_Lagadu/Getty Images
© Juanmonino/Getty Images

**Question 6**
© hadynyah/Getty Image



P58204A02020

https://xtremepape.rs/

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA